# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## පුවත් පත් දැන්වීමයි

## පැරණි ප්‍රතිඵල ලේඛන පරිහරණයෙන් ඉවත් කිරීම

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පාර්ලිමේන්තු මහ ලේකම්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් , ප්‍රධාන ලේකම්වරුන් , දිස්ත්‍රික් ලේකම්වරුන්, පොලිස්පති, ත්‍රිවිධ හමුදාපතිවරුන්, ප්‍රාදේශිය ලේකම්වරුන්, අධිකරණ විනිසුරුවරුන්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, සියලුම සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්, අධ්‍යක්ෂවරුන් සහ ආයතන ප්‍රධානීන් සහ මහජනතාවගේ දැන ගැනීම පිණිසයි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පැරණි ප්‍රතිඵල ලේඛන පරිහරණයෙන් ඉවත් කිරීමේ විධිමත් වැඩ සටහනක් ක්‍රියත්මක කිරමට සැලසුම් කර ඇත. එබැවින් 1965 වර්ෂය සහ ඊට පෙර වර්ෂවල අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ /උසස් පෙළ, විභාගවලට සහ ඒ හා සමාන විභාගවලට පෙනී සිටි, එහෙත් මෙතෙක් විභාග ප්‍රතිඵල සනාථ කර නොමැති, උක්ත සේවා ආයතනවලට අයත් නිලධාරීන් / සේවක මහත්ම මහත්මීන්ගේ විභාග ප්‍රතිඵල සනාථ කිරමට මවිසින් කඩිනම් වැඩ පිළිවෙලක් හඳුන්වා දී ඇත.

ප්‍රතිඵල සනාථ අයදුම්පත් නියමිත ආකෘතියේ සකස් කර විභාග ප්‍රතිඵල සටහනේ පිටපතක් ද සමග 2006.01.31 වැනි දිනට පෙර විභාග දෙපාර්තමේන්තුවට ලැබෙන්නට සලස්වන ලෙස ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධයෙන් විධිමත් ලිපියක් අදාළ කාර්යාල හා ආයතන වෙත දැනටමත් යවා තිබේ. ඉදිරියේ දී 1965න් පසු වර්ෂ සඳහා ද පිළිවෙලින් මෙම වැඩ පිළිවෙල ක්‍රියාත්මක කෙරෙනු ඇත.

එමෙන් ම ඉහත කී වර්ෂවල පෞද්ගලික අයදුම්කරුවන් ලෙස විභාගවලට පෙනී සිටි අය ද විභාග ප්‍රතිඵල සටහනක් ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම්, එම අවශ්‍යතාව පැහැදිලි කර නියමිත* අයදුම් පත්‍රයක් විභාග දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් විභාග ප්‍රතිඵල සටහනක් ලබාගත හැකිය. අදාළ වැඩිදුර විස්තර, විභාග දෙපාර්තමේන්තුවේ සහතික පත්‍ර ශාඛාවෙන් ලබා ගත හැකිය.

* www.doenets.lk වෙබ් අඩවියෙහි අයදුම් පත්‍රය ඇතුලත් කර ඇත.

අනුර එදිරිසිංහ
විභාග කොමසාරිස් ජනරාල්

සහතික පත්‍ර ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
පැලවත්ත, බත්තරමුල්ල.
2005.10.25 දින.

දුරකථන අංක: 2784323
දිගුව - 2786200/ 256-234- 254- 255